සුසුම් සියොළඟ දවාලයි නම්
කඳුළු බිඳුවත් හද බිඳියි නම්
ආදරය දැසේ කැඩපතක් නම්
මා ද මිනිසෙකි නුඹට නොවෙනස්

ජී.එල්.මධුෂාණි කෞශල්‍යා

පෝ

ප්‍රථම මුද්‍රණය : 2021 අප්‍රේල්

2021 ©මුතුමුදලිගේ නිශ්ශංක

ISBN 978-624-5552-01-6

මුද්‍රණය

විජේසූරිය එන්ටර්ප්‍රයිසස්

350/2 හිඹුටාන පාර,

මුල්ලේරියාව

සෝදුපත් පරීක්ෂාව සහා පිටු සැකසුම

කාවින්ද්‍යා රත්නායක

කවර නිර්මාණය

ප්‍රදීප් ප්‍රේමලාල්

බෙදාහැරීම

පොත්මී ප්‍රකාශන

# පිදුම

සමාජයේ නින්දාවට සහා අපහාසයට ලක් වෙමින්
ජීවත් වුනු සහා තවමත් ජීවත් වන
"නපුංසකයින්" නමින් ඔබ හඳුන්වන
ඔබ මෙන්ම ලේ, මස්, ඇට, නහරින් සෑදුනූ
එම දයාබර මනුස්ස කොට්ඨාශය වෙත
"පෝ" පිරිනමමී !

කර්තෘගේ අවසරය නිසි පරිදි ලිඛිතව නොලබා මෙහි එන කිසිවක්ම, කවර ආකාරයකින් හෝ නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අත් අකුරින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, ශ්‍රව්‍ය හෝ රූපණ ප්‍රකාශන ලෙස නිර්මාණය කිරීම,

ඊ-බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුලත් බව සලකන්න.

**සියලුම හිමිකම් ඇවිරිණි.** මුතුමුදලිගේ නිශ්ශංක 2021

මා දරුණු ස්නායු රෝගයකින් පෙළෙමි. සියුම් වූ ස්නායු තන්තු මිරිකා දමමින් විටින් විට නැග එන මේ දරුණු රෝගය නිසා මා දැඩි වේදනාවක් විඳිමි. මෙතරම් කටුක දුකක් විඳිමින් මිය යෑමට තරම් මා කළ පාප කර්මය කුමක්දැයි මා දන්නේ නැත.

දිනෙක මෙම රෝගය මා මරා දමනු ඇත. නැතහොත් මගේ මුළු ප්‍රාණයම අඩපන කරණු ඇත. මා මරණයට බිය නොවිමි. කිසියම් දිනෙක මෙම රෝගය මාව සම්පූර්ණයෙන්ම අබ්බගාතයෙකු බවට පත් කළහොත් මගේ තුවක්කුවෙන්ම මම මාගේ ප්‍රාණය නිරුද්ධ කර දමමි. එය මා ශපථ කර හමාරය. එය එසේම සිදුවිය යුතුය. දැන් එලඹ ඇත්තේ මරණය මාව රැගෙන යනතුරු මෙම කතාව ලියා තැබීම පමණකි.

ඔබ මෙය කියවන විට මා ජීවතුන් අතර නොසිටිය හැක. එවිට "මෙවන් මිනිසෙකු සැබැවින්ම ජීවතුන් අතර සිටියාදැයි?" යන උභතෝකෝටික ප්‍රශ්ණය මගෙන් ඇසීමට ඔබට නොහැකිවනු ඇත. එහෙයින් මෙය පටන් ගැනීමට පෙර මා මෙය දිවුරා ප්‍රකාශ කර සිටිමි. මෙය සත්‍ය කතාවකි.

හෙක්ටර් රන්දෙණිය

විශ්‍රාමික පොලිස්පති

# පළමු මිණිමැරුමට සතියකට පෙර

අලුතින් පත්වී එන හින්නළුව ප්‍රධාන පොලිස් නිලධාරී නීල් ගුණරත්න පැදවූ කොරොල්ලා කාරය හින්නළුව ප්‍රධාන මාර්ගය දිගේ ඉදිරියට විත් එතැන වූ අතුරු පාරකින් වමට හැරවීය. මෙතැන් සිට තවත් කිලෝමීටර පහක් පමණ ගිය පසුව රිදීගම නමින් හැඳින්වූ කුඩා ග්‍රාමයටත්, එතැනින් හින්නළුව පොලිස් ස්ථානයටත් පැමිණිය හැක. වේලාව දහවල් දෙක පමණ වී තිබුණෙන් මාර්ගය පැහැදිලි සූර්යාලෝකයෙන් යුක්ත විය. ඉදිරි මාර්ගය සම්පූර්ණයෙන්ම පාළුවට ගොස් තිබුණු නිසාවෙන් නීල් මෙම කුඩා අතුරු පාරෙහි වේගයෙන් රථය ධාවනය කරමින් සිටියේය.

කොරොල්ලා රථය අතුරු පාරේම වූ තවත් හංදියකට එත්ම නීල්ගේ දෑස යමක් දුටුවේය. ඒ දුටුදෙයින් ඔහු කොයිතරම් භීතියට පත් වීද යත් එම අනපේක්ෂිත දර්ශනය නිසා ඔහුගේ මුළු මනසම සීතලව ගියේය. ඔහු දුටුවේ ගිනිගෙන දැවෙන මිනිසෙකි. ශරීරයෙන් නැගෙන ගිනි ජාලයක් සමග මේ මිනිසා පාර මැද හිටගෙන සිටියේය. ඔහුගේ දෑස එක් එල්ලේම කාරයේ සිටින නීල් දෙස එල්ල වී ඇත. ඔහු දැවෙන ගින්නත් සමග ඉදිරියට වේගයෙන් යමින් තිබුණු කාරය දෙසට එන්නට පටන් ගත්තේය. මේ සියල්ලම තත්පර කිහිපයක තරම් ක්ෂණයකින් සිදුවිය. නීල් තුෂ්නීම්භූත විය. සුක්කානම ඔහුගේ දෑතින් ගිලිහි ගියේය. ඔහුට කළ හැකිව තිබුණේ එකම දෙයකි. ඔහු තිරිංග තද කළේය.

ඒත් සමගම කාරය මාර්ගයෙන් ඉවතට වීසිවී ගියේය. නීල් එය පාලනය කිරීමට උත්සහා කළේ නැත. ඔහුගේ දෑස එක එල්ලේම ඔහු විසින් දුටුවා යැයි සිතූ ඒ දෙයට යොමු වී තිබුණි. මාර්ගයෙන් ඉවතට විසිවී ගිය කාරය, ඒ අසල වූ ගොහොරු මඩ බිමකට වැටී නතර විය.

# පෝ

මුතුමුදලිගේ නිශ්ශංක

Beta Readrs

මංජුල විජේසිංහ
චින්තක වීරේන්ද්‍ර
රොහාන් මිරිහාගල්ල

පොත්මී ප්‍රකාශන
Muthumudalige Holding (Pvt) Ltd.
K Cyril C Perera Mw,
Kotahena, Colombo 13.

# ආරම්භය

## දිනය ජූනි 7

පොලිස් ස්ථානයේ දැඩි නිහැඬියාවක් පැවතින. පොලීසියට ඇතුලු වන ප්‍රධාන දොරටුව අසල වූ මේසයක් ළඟ පොලිස් සැරයන්වරයා වාඩිවී සිටියේය. ඔහු තම අතෙහි වූ ජංගම දුරකථනයෙන් නාදවන හින්දි සිංදුවක් සෙමෙන් මුමුණමින් සිටි අතර ඊට එහා පසින් මඳක් ඇතුලට වන්නට පිහිටි තනි කාමරයක, පොලිස් ප්‍රධානියා තම මේසය මත තැබූ කුඩා කණ්නාඩියක් දෙස බලාගෙන හිසෙහි වූ වෙළුම් පටි ඉවත් කරමින් සිටියේය. ඒවා ඉවත් කරන ගමන් ඔහු නිරාවරණය  වෙන හිසෙහි වූ තුවාලය කණ්නාඩියට ළං කර බැලීය. දින කිහිපයක්ම ගතවී තිබුණත් එය තවමත් සුවවී නොමැත.

සැරයන්වරයා ජංගම දුරකථනය දෙස බලන ගමන් විටින් විට පොලිස් ස්ථානාධිපතිවරයාගේ කාමරය දෙසත් බැලීය. එසේ බලන ගමන් සෙමෙන් සෙමෙන් යළිත් ගීතය මුමුණන්නට පටන් ගත්තේය.

"තූ චීස් බඩී හේ මස්ත මස්ත

තූ චීස් බඩී හේ මස්ත්" ඔහු මිමුණුවේය.

ඒ ගීතයේ තාලයටම ඔහුගේ හිස මඳක් එහාට මෙහාට සොලවමින් යළි යළිත් හොරෙන් ප්‍රධාන නිලධාරියාගේ කාමරය දෙස බැලුවේය. තමා ගීතයක් නරඹමින් සිටින බැව් තම ප්‍රධානියා නොදැකිය යුතු යැයි ඔහු සිතන්නට ඇත. ගීතය නිසාම ඔහුගේ දෙනෙත් ආලෝකමත් වී තිබුණි. එහෙත් ඒ සතුට ඊළඟ මොහොතේදී සිදුවූ දෙයින් මොහොතකින්  නැතිවී ගියේය.

∞

කාර්යාලය දෙදෙරවමින් දුරකථනය නාද දෙන්නට විය. තමා නරඹමින් සිටි ගීතය නැවැත්වූ සැරයන්වරයා රිසිවරය අතට ගත්තේය. අනෙක් පසින් ඇසුණු කිසියම් වූ දෙයක් නිසා ඔහුගේ දෙනෙතෙහි වූ ප්‍රීතිය අතුරුදහන් වී ගියේය. දෙනෙත් වික්ෂිප්තව විශාල විය. එක්වරම පුටුවෙන් නැගිටගත් ඔහු ප්‍රධාන නිලධාරියාගේ කාර්යාලය දෙස බලා

"සර් නීල් මේක ගන්න" යැයි පවසමින් ඇමතුම ප්‍රධානියාට යොමු කළේය.

ඊළඟට වන්නේ කුමක්දැයි ඔහු හොඳාකාරවම දැන සිටියේය. තම රාජකාරි හිස්වැස්ම දමාගත් ඔහු, පොලිස් ජීප් රථයේ යතුර අතට ගෙන ප්‍රධාන නිලධාරියාගෙන් එම විධානය ලැබෙන තුරු බලා සිටියේය.

"කොහේද ?"

ප්‍රධාන නිලධාරියා ඇමතුම දුන් තැනැත්තාගෙන් අසනු ඔහුට ඇසිණ.

"හරි අපි දැන් එනවා" කියූ ඔහු වේගයෙන් කාර්යාලයෙන් එළියට ආවේය.

"සහීර්, ජීප් එක ගනින්" එළියට පැමිණෙන ගමන් තමන් ඉදිරියේ සිටි සැරයන්වරයා දෙස බලා ඔහු පැවසීය.

# පළමු මරණය

පොලිස් ජීප් රථය රිදී ගල නමින් හඳුන්වන එම දැවැන්ත කඳු මායිම දිගේ විත් කැලෑව තුලට යන අතු පාරකට හැරවීය.

"උඹට විශ්වාසද මේ පාර කියලා"

"ඔව්, සර් එන්න කලින් ඕක ප්‍රසිද්ධ පොට් එකක්. කොටින්ම ඉස්සර ඔය තානායම සති අන්තයේදී ගෙස්ට්ලගෙන් පිරිලා යනවා"

"ටුවරිස්ට්ලගෙන්ද ?"

"හින්නළුවට කොහේද සර් ටුවරිස්ට්ලා එන්නේ"

ජීප් රථය පදවන ගමන් සහීර් සිනාසුණේය. කෙට්ටු තැනැත්තෙකු වූ ඔහුගේ මුහුණ මඳක් වකුටු එකක් වූ අතර ඔහුගේ දෙනෙත් විශාල නොවූ කුඩා ඒවා වූයෙන් ඔහු සිනා සෙන විට ඒවා තවත් පුංචි වී ගියේය. මුස්ලිම් තැනැත්තෙකු වූ සහීර් අවුරුදු පහකට ආසන්න කාලයක් හින්නළුව පොලීසියේම සැරයන්වරයෙකු ලෙස සේවය කර ඇති අතර, ඒ නිසාවෙන්ම මේ ප්‍රදේශය ගැන අලුතින් පත්ව පැමිණි ප්‍රධාන පොලිස් නිලධාරියාට වඩා බොහෝ දේ දැන සිටියේය.

"උඹ මොකද හිනාවෙන්නේ" ප්‍රධානියා ඔහුගෙන් ඇසුවේය.

"ඒක වෙනම ජාතියක කතාවක් සර්.." කියූ ඔහු නීල් ගේ හිස දෙස බැලුවේය.

"සර් තුවාලෙන් ලේ එනවා" දුරකථන ඇමතුම නිසා නීල් පොලිස් ස්ථානයෙන් එළියට ආවෙන් ඔහුට හිසෙහි වූ තුවාලය සම්පූර්ණයෙන්ම අමතකවී තිබුණි. ඔහු පැති කණ්නාඩියෙන් ඔහුගේ හිස දෙස බැලුවේය. නළලත මුදුනේ වූ තුවාලයෙන් රුධිරය

වැක්කෙරෙමින් ඇත. තම සාක්කුවේ වූ ලේන්සුවක් ඉවතට ගත් නීල් එය තුවාලය වැසෙන සේ නළලත හරහා බැඳගෙන තම රාජකාරි හිස් වැසුම එය ආවරණය වන ලෙස පැළඳ ගත්තේය. එය දුටු සහීර් සිනාසෙන්නට පටන් ගත්තේය.

"මොකද උඹ හිනාවෙන්නේ" නීල් ඔහුගෙන් ඇසුවේය.

"නෑ සර් නිකන්" සහීර් ගාණක් නැතිව කීවේය.

"නෑ... නෑ... කියපන්, උඹ මොකටද හිනා වුණේ" නීල් යළිත් ඇසීය.

සහීර් ගැඹුරු බැල්මකින් නීල් දෙස බැලීය.

"සර්ට හොඳටම විශ්වාසද සර් ඒක දැක්කා කියලා?"

"ඔව්... ඇයි."

"නැහැ සර්... මම මේ ගමේ මේ ජීප් එකේම දැනට අවුරුදු පහක් විතර ඩ්‍රයිවින් කරනවා. මේ හින්නඑවේ හැම අස්සක මුල්ලකම කරක් ගහලා තියෙනවා. ඒත් සර් කියන ඔය අවතාර මම අද වෙනකන් දැකලා නැහැ"

සහීර් එසේ කියා අවසන් වෙත්ම ඔහුගේ ජංගම දුරකථනය නාද දෙන්නට විය.

"තූ චීස් බඩී හේ මස්ත මස්ත

තූ චීස් බඩී හේ මස්ත් "

'ජමීලා' එහි තිරයේ සටහන් විය. එය දුටු විගසම සහීර් එය විසන්ධි කර දැමීය. ප්‍රධානියා එය දුටුවාදැයි බැලීමට ඔහු තම පැති කණ්නාඩියෙන් නීල්ගේ මුහුණ දෙස බැලිය.

"උඹ ඒක රින්ග් ටෝන් එකටත් දැම්මද?"

"මොකක්ද සර්"

"උඹ හැම වෙලේම කිය කිය ඉන්න සිංදුව"

සහීර් මෙවර මඳක් හයියෙන් සිනාසුනු අතර එහෙත් කිසිදු සිනහවකින් තොරව තමන් දෙස බලා සිටින ප්‍රධානියාව දුටු ඔහුගේ

සිනහව සෙමෙන් වියැකී ගියේය. පසුව ලැජ්ජාවෙන් මෙන් ඔහු කතාව වෙන පැත්තකට හැරවුයේය.

"සර් නීල් තවම හින්නඑවට ඇවිත් සතියක් වත් නැහැනේ. ඒ නිසා ඔය තානායම ගැන දන්නේ නැහැ. ඒත් මෙහේ ජීවත්වන පොඩි එකා පවා ඕක ගැන හොඳට දන්නවා"

සහීර්ට එය කියා අවසන් කිරීමට ඉඩක් ලැබුණේ නැත, යළිත් ඔහුගේ දුරකථනය නාද දෙන්නට විය.

එය තබා තිබුණේ සහීර් ඉදිරියේම සුක්කානම අසල වූ ආධාරකයේ බැවින් නීල්ට දුරකථන තිරය හොඳින් දැකබලා ගත හැක. එහි "ජමීලා"යන නම සටහන් ව ඇත. නීල් බලා සිටියදීම දුරකථනය අතට ගත් සහීර් එය විසංධි කර දැමීමට සූදානම් විය.

"ආන්සර් කරපන් ඕකට, නැත්නම් ඔය කෙල්ල ඕක නවත්තන්නේ නැහැ"

තම ප්‍රධානියාගේ අනපේක්ෂිත විධානයෙන් තීරණය වෙනස් කළ සහීර් ඇමතුමට පිළිතුරු දුන්නේය.

"හබීබී, අද රෑට ඔයා එනවද?" අනිත් පසින් ඇසුණේ කාන්තාවකගේ ළයාන්විත හඬකි. එයත් සමගම සහීර්ගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවී ගියේය. උඩු කණ්නාඩියෙන් යළිත් ප්‍රධානියා දෙස බැලූ ඔහු

"ජමී, මම පස්සේ ගන්නම්" යැයි පවසා ඇමතුම විසන්ධි කර දැමීය.

ජීප් රථය පුරා මද නිශ්ශබ්දතාවයක් පැතිර ගියේය. නීල් ජනේලයෙන් ඉවත බලාගෙන මුවින් නැගුණු සිනහව තද කරගනිමින් සිටියේය. සහීර් කිසිවක් නොකියාම කැලෑවේ අතුපාර දිගේ ජීප් රථය පැදවූයේය.

මොහොතකින් උගුර මඳක් පාදා ඔහු යළිත් කතාව පටන් ගත්තේය.

"සර්... සිරිමෙවන් මුදලාලිව පොලීසිය ඇල්ලුවට පස්සේ ඔය

තානායම අවුරුද්දකට කලින් සම්පූර්ණයෙන්ම වහලා දැම්මා,"

"කවුද සිරිමෙවන්?"

"ඕකේ අයිතිකාරයා. ඉස්සර හින්නළුවේ හිටිය කෙරුම් කාරයෙක්. මිනිහගේ තමයි ඔය තානායමත්"

"මොනවටද මිනිහව ඇල්ලුවේ"

"කැලෑවේ ජාවාරම් කරනවා කියලා"

"මොන ජාවාරම්ද?"

"කුඩු, ඒත් ඒක නෙමේ ඇත්ත කතාව. මිනිහා කුඩු ජාවාරම් කරන්න ඇති, ඒ එක්කම ඊට වඩා ලොකු ජාවාරමක් මිනිහා කළා"

"ඒ මොකක්ද?" නීල් ඔහුගේ ඉදිරියට නෙරාවිත් ඇති දෙනෙත් සහිර් දෙසට හරවමින් ඇසුවේය.

"ගණිකාවන්" සහිර් මුස්ලිම් කෙනෙකු වූවත් ඔහුට හොඳින් සිංහල භාෂාව කතා කිරීමේ හැකියාවක් තිබුණි. එහෙත් සමහර වචන උච්චාරණය ඔහුට පහසු වූවේ නැත.

"ගණිකාවන්" නීල් සහිර් දෙස බලා ඔහුට ඇසුණු දෙය නිවැරදි කර ගැනීමට මෙන් යළි ඇසුවේය.

"ඔව්... ඒත් ගැහැණු නෙමේ.." සහිර් එසේ කියත්ම නීල් ඔහු දෙස යළිත් වික්ෂිප්ත වූ බැල්මක් හෙලීය.

"මොනවද උඹ මේ කියන්නේ?"

"ඔව් සර්. ඒ ගැහැණු නෙමේ... පිරිමි, ඔය තානායම මුලින්ම පටන් ගත්තේ කොත්මලේ පැත්තේ විනෝදෙට එන මිනිස්සුන්ට නවාතැන් ගන්න, එහෙත් ටික කාලෙකින් ඕක ටිකෙන් ටික වෙනස් වෙලා එහෙම් පිටින්ම කණපිට හැරුණා. මිනිස්සු නම් කියන්නේ සිරිමෙවන් නපුංසකයෙක් කියලා. ඒ කියන විදියට නපුංසකයන්ට තියෙන ලොල් කම නිසාම සිරිමෙවන් ඔය තානායමට නිතර දෙවේලේ නපුංසකයන්ව ගෙන්න ගත්තලු. ඊට පස්සේ ඕක උන්ගේ නිත්‍ය නවාතැනක් වෙලා. ඒත් හොඳම හරිය පටන් ගන්නේ ඊට පස්සේ"

"ඒ මොකක්ද?"

"ඊටපස්සේ තමයි ඒක පිරිමි  නපුංසකයන් විකුණන තැනක් බවට පත් වෙලා තියෙන්නේ. මම දැන් මෙහෙට ඇවිත් අවුරුදු පහක් වෙනවා. මෙහේ ආපු මුල්ම කාලේ ඕකට මිනිස්සු කිව්වේ 'පොන්න තානායම' කියලා. සර්ට පේනවද අර තියෙන කම්බි වැට ?"

සහීර් ඔහු ඉදිරියේ ඇති මාර්ගයේ මීටර් කිහිපයක් දුරින් ඇති කම්බි වැට පෙන්නමින් පැවසීය. මෙම කම්බි වැට හරියටම ජීප් රථය ධාවනය කළ අතුපාර අවහිර කොට ඉදිකර තිබුණු අතර, අතු පාරෙන් එයට ඇතුලු වන තැන යකඩ ගේට්ටුවක් දමා තිබුණි.

කම්බි වැට අසලටම ගිය සහීර් ජීප් රථය එම යකඩ ගේට්ටුව ඉදිරියේ නැවැත්විය.

"සර් ඉන්න මම මේක ඇරලා එන්නම්" කියූ ඔහු ජීප් රථයෙන් බැස ගොස් අතු පාරට බාධා කරමින් සාදා තිබුණු ගේට්ටුව අසලට ගියේය.

නීල්ද ජීප් රියෙන් බැස එතැනට යන්නට පටන් ගත්තේය. යන අතරතුර ඔහු වනාන්තරය තුල සාදවා තිබුණු මෙම යකඩ වැට හොඳින් පිරික්සුවේය. වනාන්තරයක් තුල මෙවන් වැටක් බැඳීම සාමාන්‍ය තානායමක් හිමි කෙනෙකුට කළ නොහැක. මෙවැනි දෙයකට රජයෙන් විශේෂ අවසරයක් ලබා ගත යුතුය.

"මම දන්නවා සර් හිතන්නේ මොකක්ද කියලා" වැට අසලට යමින් නීල් ගේ මුහුණ දෙස බැලූ සහීර් පැවසුවේය.

"ඇතුලේ තියෙන්නේ තානායමද ?"

"ඔව් සර්, හැබැයි තව කිලෝ මීටර් දෙකක් විතර ඈතට වෙන්න"

"මොකක්! උෆ්ට කොහොමද මෙච්චර හයියක්?. මේවා ගැන හොයලා බලන්න කවුරුත් හිටියේ නැද්ද ?"

"වැඩක් වුණේ නැහැ සර්. ඔබතුමා එන්න කලින් හින්නඑව පොලිසියට ආපු ලොක්කෝ දහදෙනෙක්ව විතර ට්‍රාන්සර් කරලා

දැම්මා. ඒත් සරත් මහත්තයා, ඒ කියන්නේ සර් එන්න කලින් හිටපු ලොක්කා, මිනිහා තමයි ඔය කුඩු නඩුව දාලා සිරිමෙවන්ව හිරකරලා දැම්මේ, ඒත් ඒකෙන් වුණේ සරත් මහත්තයාවත් මාරු කරලා දාපු එක විතරයි. ටික දවසකින් ඌ නිදහස් වුණා"

සහීර් යකඩ බරාදයකට මූට්ටු කර තිබුණු ගේට්ටුවේ ගාංචු බුරුල් කර ගේට්ටුව විවර කළේය. සම්පූර්ණයෙන්ම දොරටුව විවර කළ ඔවුන් යළිත් ජීප් රථය දෙසට පැමිණියේය.

"ඔය නපුංසක ව්‍යාපාරේ තියෙන කාලේ ඉස්සර මේ ගමට අමුතු අමුතු ජාතියේ මිනිස්සු එනවා. උන් එන ලක්ෂරි කාර් දැක්කම කියන්න පුළුවන් ලංකාවේ ඉන්න හොඳම සල්ලිකාරයෝ කියලා. පාර්ලිමේන්තුවේ එවුනුත් මෙතැනට එනවා මිනිස්සු දැකලා තියෙනවා. ඕක නිසා තමයි සිරිමෙවන් මේ වගේ අමන බිස්නස් එකක් ජයටම කරගෙන ගියේ. ඌට සරත් මහත්තයව විතරයි හරියට නවා ගන්න බැරි වුණේ.

අනිත් හැමෝම හිටියේ ඌගේ සාක්කුවේ"

සහීර් යළිත් ජීප් රථය පණගන්වා ගත්තේය. ගේට්ටුව පසුකළ ජීප් රථය තානායම කරා එන්නට විය.

"එතකොට කොහොමද ඕක වැහුනේ?" නීල් යළිත් සහීර්ගෙන් විමසුවේය.

"ගින්නකින්"

"ගින්නකින්?"

"ඔව් සර් ගින්නකින්, සිරිමෙවන් හිරේ හිටිය කාලෙම ඔය තානායම ගිනිගත්තා. කොන්ක්‍රීට් කණු ටික ඇරෙන්න අනිත් හැමදේම අළු වෙලා ගියා. සිරිමෙවන්ගේ දේකට අතක් තියන්න තරම් කොන්දක් තියෙන එකෙක් මේ ගමේ නැහැ. ඕක මේ තානායමටම ආපු කෙරුමෙක්ගේ වැඩක්. තානායමේදී කරපු දේවල් වහගන්න සේරම අලු කරලා දාන්න ඇති."

∞

ගේට්ටුවේ සිට තානායමට යන මාර්ගය මීට පෙර තිබුණු මාර්ගය මෙන් පටු එකක් නොවීය. එය හොඳින් කාපට් කර තිබුණු අතර මේ මාර්ගය ඔස්සේ ගමන් කරන කවරෙකුට හෝ වේවා කැලෑව මධ්‍යයෙන් වැටී තිබුණු අතු පාරත්, මෙම මාර්ගයත් සංසන්දනය කර බලන විට, තානායම කාලයක් හොඳින් නඩත්තු කොට තිබුණු තානායමක් බව වැටහෙනු ඇත. එහෙත් දැන් එය සම්පූර්ණයෙන්ම අත්හැර දැමූ ස්වරූපයක් පෙනුණු අතර කිසිවෙකු ජීවත් නොවන හිස්ව ගිය පාළු භූමියක ආකාරයක් එහි විය.

# තානායම

හින්නළුව පොලිස් ප්‍රධානී නීල් ගුණරත්නත්, සැරයන් සහීර් හුසේනුත් පැමිණි ජීප් රථය "Wood Inn" නම් විශාල දැන්වීම් පුවරුවක් ඉදිරියේ නතර විය. මෙතැන සිට ඉදිරියෙන් ඇත්තේ මීට කාලයකට පෙර විරාජමානව සිටි ඒත් දැන් සම්පූර්ණයෙන්ම නටඹුන් ගොඩක් බවට පත්ව ඇති තානායමකි. එහි මැද පිහිටි, අනිත් ඒවාට වඩා මඳක් විශාල වූ කාමරය පමණක් යළිත් පිලිසකර කර තිබුණු අතර එය වටා කවාකාරව ඉදිකර තිබුණු අනිත් කාමර සියල්ලම කාල වර්ණයෙන්ද, අඟුරු වී ගිය පරාල සහිත වහලවල් වලින්ද, ගින්නෙන් අවර්ණ වූ බිත්ති සහ කොන්ක්‍රීට් කණු වලින්ද යුක්ත විය. මෙම කාමර වල බිත්ති පිටුපසින් විශාලව වැඩී තිබුණු වල් ගස් නිසාවෙන් ගින්නෙන් පසුව කිසිම දිනෙක මේවා යළි සුද්ද පවිත්‍ර කර නැතැයි සිතිය හැක.

ජීප් රථය තානායම් පුවරුව ඉදිරියේ නතර කරත්ම වයෝවෘධ කාන්තාවක් ජීප් රථය දෙසට දිව ආවාය. නවාගත් කොන්දකින් සහ කොර වූ ගමනකින් යුක්තවූ ඇයගේ දෑස් රක්ත වර්ණ වී තිබුණු අතර ඒවා ඉදිරියට ඉලිප්පී තිබුණි.

ජීප් රථය දෙසට එක එල්ලේම පැමිණි ඇය, එතැනට ළං වෙත්ම විලාප දෙන්නට පටන් ගත්තාය. ඒ විලාපයත් සමග එක් වරම ඇය ඇදවැටෙන්නට ගියෙන් නීල් ඉදිරියට දිව ගොස් ඇයව වැරෙන් අල්වා ගත්තේය.

"අනේ බුදු මහත්තයෝ... අපේ සිරිමෙවන් මහත්තයාව කවුද මරලා දාලා. ඒක මහා අමනුස්ස මරණයක් මහත්තයෝ, මට තවත් වාවගන්න බැහැ. මාවත් මේ තානායමේම දැවිලා අළු වෙලා ගියානම් මීට වඩා හොඳයි."

නීල් ඇයව වැටී සිටි තැනින් ඔසවද්දි ඇය තවත් මොර දෙන්නට විය. නීල් ඇයව වාරුවෙන් ගෙනවිත් තානායම් කොරිඩෝවේ තිබුණු දූවිලි වැදී තිබුණු වේවැල් පුටුවෙහි ඉන්දවීය.

"තමුන් කවුද?" ඔහු ඇයගෙන් ඇසුවේය.

"මම තමයි සිරිමෙවන් මහත්තයට ඉවුම් පියුම් කටයුතු කරන්නේ. අනේ දෙයි හාමුදුරුවනේ. ඊයේ රාත්‍රියේ මම තියලා ආපු බත් එකත් ඒ මහත්තයා මැරෙන්න කලින් කාලා දෙයියනේ... මට පුතෙක් වගේ හිටපු රත්තරන් මහත්තයා යන්න ගිහින් දෙයියනේ" ඇය යළිත් විලාප දෙන්නට විය.

"අපිට කෝල් කළේ ඔය අම්මද?"

"ඔව් මහත්තයෝ... සිරිමෙවන් මහත්තයා දැනගෙන හිටියා මේ වගේ අපරාදයක් කවුරු හරි කරයි කියලා. ඒ නිසා හදිසියක් වුනොත් පොලිසියට කෝල් කරන්න නොම්මරේත් ඒ උත්තමයා මට දීලයි තිබුණේ... අනේ දෙයියනේ මේවා ගිනි අරන් අළුවෙලා යන්න කලින් රජෙක් වගේ ජීවත් වෙච්ච මනුස්සයා" ඇය යළිත් විලාප නැගුවාය.

ඇය සිරිමාන්නට උත්තමයා යැයි පවසද්දි සහීර් නීල් දෙස බලා සිහින් සිනාවක් නැගුවේය.

"උත්තමයා" ඔහු නීල්ගේ කනට කර මිමුණුවේය.

"නවත්ත ගනින්" නීල් තොල් මැතිරීය. එයත් සමගම සහීර් ඔහුගේ මුවට නැගුණු සිනහව සඟවාගෙන කාන්තාව දෙසට නැමී මෙසේ ඇසීය.

"අම්මා... සිරිමෙවන් උත්තමයා මොන කාමරේද හිටියේ?" ඔහු සිනාසුනේ නැත. ඔහු එය ඇසුවේ දැඩි බැරෑරුම් මුහුණකිනි. නීල් ඔහු දෙස බලා සිටියා මිසෙක කිසිවක් කීවේ නැත. ඒත් කාන්තාව යළිත් විලාප දෙමින්,

"අර තියෙන ලොකු කාමරේ මහත්තයා" යැයි කොරිඩෝව දකුණු පසින් වූ පිළිසකර කර තිබුණු කාමරය දෙසට ඇඟිල්ල දිගු කරමින් පැවසුවාය.

"අනේ බුදු මහත්තයෝ... ඒ මනුස්සයට බල්ලෙක්ට වගේ වෙඩි තියලා තියෙන හැටි දැක්කම මාව එතැනම කලන්තේ දැම්මා. ආයෙත් සිහිය ආවේ පැය දෙකක් විතර ගිහින්. ආයෙත්නම් මට ඔය කාමරයට යන්න බැහැ" ඇය දෑත එක්කොට නීල් දෙස බලා බැගෑපත් විය.

"නෑ අම්මා මෙතන ඉන්න... අපි ඉතුරු ටික කරගන්නම්" මෙසේ කියූ නීල් සහීර් දෙස බලා ඉක්මනින්ම කාන්තාව විසින් පෙන්වූ කාමරය දෙසට යන්නට විය. සහීර් ඔහුගේ පසුපස දිව ගියේය.

∞

කාමරය තනි අන්ධකාරයේ ගිලී පැවතුනු අතර එහි කෙලවරේ වූ නානකාමරයේ විදුලි පහනින් නික්මුනු ආලෝකයෙන් පමණක් එළිය වී තිබුණි. කාමරයට ඇතුලු වුනු නීල් ස්විචය ඔබා කාමරයේ ප්‍රධාන විදුලි ලාම්පුව දැල්වූයේය.

"සහීර් ඔය ජනෙල් ඇරපන්" කී ඔහු කාමරය ඇතුලට අඩිය තැබීය. එක් වරම ඔහුගේ පාදයක් ලිස්සා ගියෙන් එතැන වූ පුටුවක් අල්වා ගත් ඔහු යළිත් හිටගත්තේය.

"සර් බලාගෙන පොළවේ වතුර" ජනේලය විවෘත කරමින් සහීර් පැවසීය.

නාන කාමරයේ සිට ගලා ආ වතුරෙන් කාමරය මුළුමනින්ම තෙත්වී ඇත. මෙය මඳක් විශාල කාමරයක් වූ අතර එයින් නික්මෙන සිමෙන්ති බදාම ගඳින්, මෙය මෑතකදී පිළිසකර කර ඇති කාමරයක් යැයි නීල් සිතීය. ඔහු කාමරයේ ඇති සියලුම දේ මනසට එකම වරක ධාරණය කරගන්නට මෙන් කාමරය සිසාරා යන පරිදි දැඩි බැල්මක් හෙලීය.

කාමරයේ හරි මැදට වන්නට ඇඳක් පිහිටි අතර එයට එහා පසින් කෑම මේසයකුත් අනිත් පසින් අල්මාරියකුත් විය. එළියේ

සිටි කාන්තාව කියූ පරිදිම ඉඳුල් වූ බත් පිඟානක් සහ ඉතුරු වුණු එළවළු ව්‍යංජන එම මේසය මත විය.

සියල්ල දෙසම හොඳින් බැලූ නීල් සීරුවෙන් යුක්තව, විදුලි බල්බයක් දල්වා තිබුණු නාන කාමරය දෙසට ආවේය.

නාන කාමරයේ දොර අසලට එත්ම එතුල වූ දසුනින් ඔහු භිරාන්තව ගියේය. කිසිම ගාණක් නොමැතිව කාමරය තුලට ආ සහීර් එය දැකීමෙන් ආ පිළිකුළ නිසාවෙන් කාමරයෙන් එළියට දිව ගොස් වමනය දැමුවේය.

නාන ටැබය සම්පූර්ණයෙන්ම ලේ සහ වතුරෙන් පිරී ඇත. එහි වතුර උඩ මළපහ පාවෙමින් තිබුණි. මිය යෑමට පෙර මරණ භීතිය නිසාම සිරිමෙවන්ට මළ පහවෙන්නට ඇත. නාන ටැබය සම්පූර්ණයෙන්ම ලේ මිශ්‍රිත වතුරෙන් පිරී තිබුණු අතර සිරිමෙවන්ගේ ශරීරයේ මුහුණ සහ පපුවෙන් භාගයක්ම වතුරේ ගිලී ඇත. එය පිටතට පෙනුනේ නැත. ඔහුගේ දෙපය නාන ටැබයෙන් පිටතට පැමිණ ඇති අතර නාන ටැබයේ සීලීමට උඩින් ඇති යකඩ බරාදයට දැමූ කඹයකින් ඔහුගේ දෙපා ඉහලට ඔසවා ශරීරය පමණක් නාන ටැබයට ගිලී යන ලෙස බැඳ දමා ඇත. ඔහුගේ සිරුර සම්පූර්ණයෙන්ම නිරුවත්ය. එහි දෙපා අතර ඇති හිඩැසෙන් ටී 56 වර්ගයේ තුවක්කු බටය බස්සා ඇත. මෙම මරණය සිදු කළ තිරිසනා කවරෙකු හෝ වේවා තුවක්කු බටය සිරිමෙවන්ගේ අධෝ මාර්ගයට බස්සවා තුවක්කුව නාන ටැබය ඉදිරියේ ලී පුටුවක් තබා එහි හරහට ගැටගසා ඇත.

නීල් තුවක්කුවෙහි කොකා වටා බැඳ ඇති සිහින් තන්ගුස් නූල දෙස බැලීය. එම තන්ගුස් නූල සිරිමෙවන්ගේ කකුල් දෙක උස්සා බැඳ තිබුණු යකඩ බරාදයේම උඩින් යවා එහිම අනිත් කොනෙන් සිරිමෙවන්ගේ දෑත් බැඳ ඇත.

නීල් මේ දෙස බලා සිටියදී සිදුවී ඇති සියල්ලම චිත්‍රයක් මෙන් ඔහුගේ මනසෙහි එකිනෙකට ඇදී ගියේය.

"සහීර්... මේක මිනීමැරුමක් විතරක් නෙමේ, ඊටත් එහා ගිය එකක්"

යළිත් කාමරයට පැමිණි සහිර් දෙස බලා ඔහු කීවේය.

"ඒ කිව්වේ සර්...?" සහීර් ඔහුගේ එක් අතක වූ ලේන්සුවෙන් මුව ආවරණය කරගන්නා අතර ඇසුවේය.

"මේක පලිගැනීමක්. මරපු එකා මොකා වුනත් ඌ පලිය දරුණු විදියට අරගෙන තියෙනවා. බලපන් තුවක්කුවේ කොකාට මූට්ටු කරලා තියෙන තංගුස් නූල දිහා"

නීල් පුටුවේ ගැටගසා තිබූ ටී 56 තුවක්කුව පෙන්වා සහීර්ට පැවසුවේය. සහීර් එම නූල දෙසත්, වතුර තුලට කඳාබැස තිබූ එහි අනෙක් කොන දෙසත් මනා බැල්මක් හෙලීය.

"මේකේ අනිත් කොන ඇයි සර් වතුර යට ?"

සහීර් එසේ කියත්ම නීල් නාන ටැබයේ වතුර බැස යන කාණුව අවහිර කරමින් තිබුණු රබර් කොපුව පයිප්පයට සවිකර තිබුණු ගාංචුවෙන් ඉහලට එසවීය. ඒත් සමගම

"ගර්ර්" හඬක් නගමින් රුධිරය සහ මළපහ මිශ්‍රිත වතුර සෙමෙන් බැසයන්නට පටන් ගත්තේය.

"අනිත් කොනෙන් සිරිමෙවන්ගේ අත්දෙක බැඳලා ඇති... බලාගෙන ඉඳපන්" කී නීල් වතුර බැසයන නාන ටැබය දෙස බලා සිටියේය.

ක්‍රම ක්‍රමයෙන් වතුර බැස ගිය අතර ටික මොහොතකින් සිරිමෙවන්ගේ උඩුකය පෙදෙස උඩට මතුවිය. ඔහුගේ දෑස් විවෘතව තිබුණු අතර ඒවා ඇස් කෙවෙනි තුලින් මඳක් ඉවතට පැමිණ ඇත. නීල් කී පරිද්දෙන්ම තංගුස් නූලෙහි අනිත් කෙලවරින් සිරිමෙවන්ගේ දෑත එක්කොට බැඳ ඇත.

"සර් මේක මහා තිරිසන් වැඩක්නේ. උණ්ඩය කෙලින්ම පුකට බස්සලා තියෙන්නේ"

"ඔව්, ඕක කරපු එකා තුවක්කුවේ බටේ මේ මනුස්සයගේ අරක ඇතුලට බස්සලා නාන ටැබ් එකේ කරාමේ ඇරලා තියෙනවා. කකුල් දෙක උඩට කරලා ගැටගහලා නිසා ටැබ් එකෙන් ගොඩට එන්න බැහැ. තියෙන්නේ විකල්පයක්. එකක් වතුර පිරෙද්දි හුස්ම හිරවෙලා මැරෙන්න. අනිත් එක අත් දෙකට මූට්ටු කරලා තියෙන තංගුස් නූලෙන් තුවක්කුවේ කොකා ගස්සන්න. මිනිහා හුස්ම හිරවෙද්දි කොකා ගස්සගන්න ඇති එහෙම නැත්නම් දඟලද්දි ඉබේම ඒක වෙන්න ඇති, උඹ ඔය හිටගෙන ඉන්න තැන ඉඳන් ඒ තිරිසනා වෙන දේ බලාගෙන ඉඳලා තියෙනවා"

නීල් එසේ කියත්ම තිගැස්සුණු සහීර් ඔහු හිටගෙන සිටි උළුවස්ස ළඟින් එක් වරම එහා පසට ගියේය.

"සර් කොහොමද කියන්නේ ඌ මෙතනමයි හිටගෙන හිටියේ කියලා" සහීර් එසේ අසත්ම නීල් සිනාසුණේය.

"බලපන් සිරිමෙවන්ගේ ඇස් දෙක"

සහීර් නාන ටැබයට මඳක් පහත් වී සිරිමෙවන්ගේ ඉවතට ඉලිප්පි විවරවී තිබූ දෑස් දෙස එක එල්ලේ බැලුවේය. එම දැස් එක එල්ලේම යොමු වී තිබුණේ නාන කාමරයේ උළුවස්ස දෙසටය.

"සිරිමෙවන් මැරෙද්දිත් මැරිලා තියෙන්නේ මරපු එකා දිහා බලාගෙන. මම උඹට එකක් කියන්නම් සහීර්. මැරෙන්න කලින් බයට මළපහ වෙන්න ඇත්තේ තමන් මැරෙන්න යන බව සිරිමෙවන් දන්න නිසා. ඒ බයට. ඒත් අන්තිම මොහොතෙදි සිරිමෙවන් දැනගෙන ඉඳලා තියෙනවා මිණිමරුවා කවුද කියලා. ඒත් ඒක දැනගත්තට පස්සේ මේ මනුස්සයට, මරන්න ආපු එකාට දෙකට නැමෙන්නේ නැතිව එක පාරම මැරිලා යන්න හිතෙන්න ඇති. ඒකයි ඌ දිහා බලාගෙනම කොකා ගස්සවගෙන මැරිල තියෙන්නේ"

"ඒ කියන්නේ මිණිමරුවා සිරිමෙවන් අඳුරන කෙනෙක්ද සර්" සහීර් ඇසුවේය.

"අඳුරන කෙනෙක්ට වඩා, සිරිමෙවන් ගණන් ගන්නේ නැති

ජාතියක එකෙක්. සරලව කිව්වොත් සිරිමෙවන්ගේ සිතීමට අනුව උඹ පහත් එකෙක්"

"හා... හා... සර් නම් නියමයි." සහීර් හිස දෙපසට වනමින් සිනහවකින් යුක්තව පැවසුවේය.

සහීර්ගේ උරහිසට තට්ටුවක් දැමූ නීල් නාන කාමරය දෙස තවත් වරක් පරීක්ෂාකාරීව බලා එතැනින් එළියට ආවේය.

ඒ මොහොතේම ඔහු රෝහලට ඇමතුමක් ගෙන මෙම මරණය ගැන දැනුම් දුන් අතර, කොත්මලේ ප්‍රධාන පොලිස් ස්ථානයට මෙම ස්ථානයේ පරීක්ෂන කටයුතු කිරීමට කණඩායමක් එවන ලෙසද දැන්නුවේය.

# ඩී.වී.ආර්

නීල් නාන කාමරයෙන් එළියට ආවේය. එළියට එත්ම ඔහුගේ දෑස ඇතුල් කාමරයේ වූ ටීවී රාක්කයටත් එතැන පහතින් වූ තවත් යන්ත්‍රයකටත් ඇදී ගියේය. මෙම යන්ත්‍රයේ කොල පැහැ පුංචි බල්බය පත්තු වී තිබුණෙන් එය කුමක්දැයි නීල් හරියටම හඳුනා ගත්තේය.

"සහීර්, අර වයසක මනුස්සයා කිව්ව කතාව හරි" ඔහු තමා පිටුපස සිටි සහීර් දෙස බලා පැවසීය.

"ඒ මොකක්ද සර්"

"සිරිමෙවන් හොඳටම දැනගෙන ඉඳලා තියෙනවා උෆව කවුරු හරි ඉක්මනටම පරලොව යවන විත්තිය. කොහොමත් උෆ ඒකට ලෑස්ති වෙලා ඉඳලා තියෙන්නේ. උඹ පලයන් ගිහින් අර මනුස්සයගේ කට උත්තරේ ලියාගනින්. මම හිතන දේ හරිනම් මේ කාමරයේ කොහේ හරී සීසීටීවී කැමරා එකක් හංගලා තියෙන්නේ ඕන"

මෙසේ කී නීල් රූපවාහිනී යන්ත්‍රය තබා තිබූ රාක්කය දෙසට ගියේය.

∞

සහීර් කාමරයෙන් එළියට පැමිණියේය. ඔහු එතැනට එන විටත් වයසක කාන්තාව ඇයව ඉන්දවූ තැනම හිඳගෙන සිටියාය.

"සර් කිව්වා අම්මගෙන් කට උත්තරේ අරගෙන අම්මව ගෙදර යවන්න කියලා. මෙතන ඉදිරියට වෙන්න ඕනේ දේවල් ටික අපි

බලාගන්නම්" සහීර් ගේ දෑස එක එල්ලේම එම වයසක කාන්තාව වෙත යොමු විය. ඇය දැඩි ආතතියකට පත් වී ඇතැයි ඔහු සිතුවේය.

"මහත්තයෝ මම දන්න සේරම ටික කියන්නම්, මහත්තයා ලියාගන්න" කියූ ඇය උදෑසන තානායමට පැමිණි මොහොතේ පටන් සිදු වූ සියල්ලම එකින් එක මතක් කර කියන්නට පටන් ගත්තාය.

∞

මහලු කාන්තාවගෙන් කට උත්තරය ගත් සහීර් ඇයව පිටත් කර යැව්වේය. ඉන්පසුව ඔහු යළිත් කාමරය වෙත එන්නට විය. ඔහු කාමරයේ දොර විවර කරද්දී, නීල් දැල්වෙමින් තිබුණු රූපවාහිනී යන්ත්‍රය නිවා දැමීය. ඒත් සමගම රූපවාහිනී යන්ත්‍රයට සවිකර තිබුණු සීසීටීවී කැමරා සම්බන්ධ කර ඇති ඩී.වී.ආර් යන්ත්‍රයේ වයර් ගලවා දැමූ ඔහු එම යන්ත්‍රය ඔහුගේ අතට ගත්තේය. එසේම සිරිමෙවන් විසින් රාක්කයේ රහසිගත ස්ථානයක සඟවා තිබියදී නීල්ගේ තීක්ෂණ ඇසට හසුවූ ඩීවීඩී තැටි කිහිපයක්ද නීල් අත විය.

එම ඩීවීඩී තැටි කිහිපයත්, යන්ත්‍රයත් අතෙහි දැඩිව රුවා ගත් ඔහු එක් අතකින් නළලතින් වැටෙමින් තිබුණු දහදිය පිස දැම්මේය.

කුමක් හෝ හේතුවක් නිසා නීල් කම්පනයට පත් ව ඇත. ඔහුගේ නළලතින් දහඩිය වැක්කෙරිමින් තිබිණ. සහීර් එය නිසැකවම දුටුවේය.

"සර්... මොකක් හරි ප්‍රශ්ණයක්ද?" සහීර් ඇසුවේය.

"ඔව්, මම ඉක්මනට පොලීසියට යන්න ඕනේ. මේක ගැන වාර්තාවක් දැන්මම ලොක්කට යවන්න තියෙනවා" යැයි කී නීල් සහීර් අත වූ පොලිස් පොත දිහා බැලුවේය.

"උඹ සේරම ලියා ගත්තද?"

"ඔව් සර්"

"ඕකත් දියන් මට. මම දැන් මම මේ සේරම කොළඹට ෆැක්ස් කරන්නම්" කී ඔහු එයත් ඉල්ලාගෙන ජීප් රථය දෙසට යන්නට විය.

"සහිර් තව ටිකකින් අපරාධ විමර්ශනෙන් මෙතනට එයි, උඹ ඒ අයත් එක්ක ආයේ පොලිසියට වරෙන්, මම වාහනේ ගන්නවා" කියූ නීල් යළිත් වරක් නැවතී සහීර් දෙස බැලුවේය.

බලා, කටහඬ බාල කොට මෙසේ කීවේය.

"මේක මම අරන් යනවා" ඔහු තම අතෙහි වූ ඩීවීආර් යන්ත්‍රය පෙන්වමින් කීවේය.

"මේක මගේ ළඟ කියලා සී.අයි.ඩී එකට කියන්න එපා. මට මේක තනියෙම බලන්න ඕනේ, උඹට තේරුණාද ?"

"ඕකේ සර්" සහීර් හිස වැනුවේය.

# පිස්සා

රාත්‍රිය ඔබ සිතන තරම් නිශ්ශබ්ද නැත, ඔබ දෙනෙත් වසා සිටින විට දහසක් දේ එම අන්ධකාරය තුල සිදුවෙයි.

ත්‍රීරෝද රථයකින් පැමිණි සහීර් කඩමණ්ඩිය අසලින් බැස්සේය. ඔහුගේ සාක්කුවෙන් සීයේ කොළයක් එළියට ගත් ඔහු, ත්‍රීවීල් රියදුරාට එය දී පිටට තට්ටුවක් දමා ඔහුව පිටත් කර හැරියේය. ඉන්පසුව ඔහුගේ සාක්කුවේ තිබුණු කාලේ අරක්කු බෝතලය එළියට ගෙන එයින් ටිකක් කටට හලාගෙන බෝතලය වසා එය යළිත් සාක්කුවටම දමා ගත්තේය.

රාත්‍රිය උදාවී ඇත. මුළු කඩමණ්ඩියම අන්ධකාරයේ ගිලී තිබුණු අතර කිසිවෙකුත් ඔහු දෙස බලා සිටීදැයි සැකයෙන් යුතුව වට පිට බැලූ ඔහු කඩමණ්ඩියේ එක දිගට තිබුණු කඩ සාප්පු අතරින් එක් කඩයක් ඉදිරියට ආවේය. ඒ එන අතර තුර ඔහුගේ දෑස මද සතුටකින් ආලෝකමත් විය. ඔහු තමන් ඉදිරියෙහිම පෙනෙන කුඩා කඩ සාප්පුවේ දෙවන මහළ දෙස බැලීය. එහි පිටත ඇති විදුලි බුබුල තවමත් දැල්වී ඇත. ඔහුගේ මුවින් මතු වූ සිනහව තවත් වැඩිවිය. කඩයේ පැත්තකින් දෙවන මහළයට යාමට තනා තිබූ විවෘත පඩිපෙළ දිගේ ඔහු ඉහළට නැග්ගේය.

දෙවන මහළයට එත්ම යළිත් වටපිට බැලූ ඔහු වසා තිබූ දොරට සෙමෙන් තට්ටු කළේය.

"ජමීලා" ඔහුගේ මුවින් සිහින් රාවයක් නික්ම ආයේය. ඒත් සමගම දොර සෙමෙන් විවර වූයේය. දොර විවර වත්ම හොරෙක් මෙන් ඒ තුලට රිංගා ගත් ඔහු, ඉක්මනින්ම දොර වසා දැමුවේය.

ජමීලා ඔහුගේ ඉදිරියේ හිටගෙන සිටියාය.

මුස්ලිම් කාන්තාවක් වූ ජමීලාගේ පියා පහත ඇති කඩ කාමරයේ බිරියානී කඩයක් පවත්වාගෙන ගිය අතර, උඩ තට්ටුව ඔවුන්ගේ නිවස ලෙස පාවිච්චි කළෝය. එසේම රාත්‍රියේ පියා නිදාගත්තේද කඩයෙම බැවින් ජමීලා පමණක් උඩ තට්ටුවේ සිටියාය.

කාමරයට ඇතුලු වූ සහීර් ජමීලා දෙස බැලුවේය. රෝස පැහැති සේද සල්වාරියක් හැඳ සිටි ඇයගේ දෙනෙත් දිලිසෙමින් තිබුණි. ඒවා එක එල්ලේම සහීර් දෙස එල්ල වී ඇත. එම සල්වාරියේ පාටම සේද සලුවක් ඇය හිස හරහා දමා සිටියාය. ඇයගේ නළලතෙහි කළු පැහැ කුඩා මොට්ටුවක් විය. සහීර් ඇය දෙස බලාගෙන මොහොතක් සිටියේය.

"ජමී" ඔහු සෙමෙන් මිමුණුවේය.

"උඹ හරි ලස්සනයි කෙල්ලේ" කී ඔහු සෙමෙන් සෙමෙන් ජමීලා ළඟට ආවේය. මත්පැන් වලින් ඔහුගේ දෑස රතුවී තිබුණි.

ජමීලා ළඟටම පැමිණි ඔහු ඇයගේ දෙතොල් උරාගත්තේය. ජමීලා එතැනම ගල් ගැසී හිටගෙන සිටියාය. ඇය තම දෑස් ඔහුගෙන් ඉවතට ගත්තේ නැත. ඒත් ඔහු දෙතොල් උරාගනිද්දි ඇයගේ දෑස් ඉබේම වැසී ගියාය. ඇයගේ ශරීරය මුළුමනින්ම අඩපන විය.

සහීර් ඇයගේ සල්වාරිය ඔලුවෙන් ගලවා දමා ඇයව ඇඳට තල්ලු කළේය.

"අද මම දෙකක්ම ගත්තා" කී ඔහු තම සාක්කුවේ වූ කොන්ඩම් පැකට් දෙක ජමීලාට පෙන්නුවේය.

"මට අද දෙපාරක්ම ඕනේ"

"පිස්සා" ජමීලා සිනාසෙමින් පැවසුවාය.

"ඔව්... උඹ හින්දා... මගේ ජමීලා හින්දා" කී ඔහු අඩක් එළියට නිරාවරණය වී තිබුණු ඇගේ පියයුරු දෙස බැලීය.

# තීරණය

නීල් ඔහුගේ අතෙහි වූ ඩී වී ආර් යන්ත්‍රය විවර කොට එහි හාර්ඩ් ඩ්‍රයිවය එළියට ඇද ගත්තේය. ඉන්පසුව එයත් රැගෙන මිදුලට ගිය ඔහු, මිදුල මැද යකඩ බාල්දියක් තබා එයට දර කිහිපයක් දමා ගිනි ගොඩක් ගැසුවේය. ගින්න ක්‍රමයෙන් වැඩී වීගෙන එද්දි ඔහු තම අතේ වූ හාර්ඩ් ඩ්‍රයිවය ගින්නට විසි කළේය. එය දැවී යන්නට විය.

එය මුළුමනින්ම දැවී ගොස් බාල්දියේ වූ ගින්නත් ක්‍රමයෙන් වියැකී යන තුරුම ඒ දෙස බලාගෙන සිටි ඔහු අවසානයේදී යළි නිවසට ආයේය.

ඒත් තවමත් ඔහුගේ මුහුණේ ඇත්තේ ප්‍රශ්ණාර්ථයකි. නිවසට ආ විගසම සාලයේ වූ අල්මාරිය අසලට ගිය ඔහු එයින් බ්‍රැන්ඩි බෝතලයක් ගෙන එයින් ස්වල්පයක් වීදුරුවට හලා ගත්තේය. ඔහුගේ දෑස් කල්පනාවෙන් බර වී තිබුණි.

බ්‍රැන්ඩි ස්වල්පයක් උගුරට දමා ගත්තත් එම කල්පනාව ඔහුගේ මුහුණින් පහව ගියේ නැත. අල්මාරිය අසලම හිටගෙන ඔහු කල්පනා කළේය. ඔහුගේ දෑස් ඒ මොහොතේම නිවසේ ටීපෝව මතම තබා තිබුණු හාර්ඩ් ඩ්‍රයිවයකින් තොර වූ ඩීවීආර් යන්ත්‍රය දෙසටත් එතැනම වූ තවමත් ක්‍රියාත්මක වෙමින් පැවති කුඩා පරිගණකය වෙතටත් ඇදින.

තවත් සුළු මොහොතකින්ම ඩීවීඩී තැටිවල වූ සියල්ලම පරිගණකයෙහි තැන්පත් වනු ඇත. ඉන්පසුව ඇත්තේ පරිගණකයෙන් ඒ සියල්ලම ඔහුගේ ෆ්ලෑෂ් ඩ්‍රයිවයට ගබඩා කර ගැනීමයි. එය වඩාත් ආරක්ෂිත වනු ඇතැයි ඔහු සිතුවේය.

මොහොතක් ගෙවී ගියේය.

"ට්‍රීක්" හඬක් නගමින් ඩීවීඩි තැටිය පරිගණකයෙන් එළියට ආවේය. කාර්යය අවසන් වී ඇත. ඒ මොහොතේම සාක්කුවෙන් කුඩා ෆැලැෂ් ඩ්‍රයිවයක් එළියට ගත් නීල් පරිගණකයට ගබඩා කළ වීඩියෝ පට යළිත් ඔහුගේ ෆැලැෂ් ඩ්‍රයිවයට කොපි කරගත්තේය.

කාර්යය අවසන් වූ පසු පරිගණයක වසා දැමූ ඔහු, එය සෝපාවේ කකුල් යටින් වූ විවරයේ සැඟවිය. ඉන්පසුව ඩීවීඩී තැටි දෙකින් එකක් අතට ගත් ඔහු එකක් ඩීවීඩි යන්ත්‍රය තුලට දමා අනික ටීපෝව උඩ තැබුවේය.

ඩීවීඩී යන්ත්‍රය ධාවනය වන්නට විය. නීල් මෙය කිහිප වතාවක්ම නරඹා තිබුණි. එහෙත් ඒ සෑම වතාවකම ඔහුගේ දෑස දැඩි පිළිකුලෙන් සහ කෝපයෙන් රක්ත වර්ණ වූවා හැරෙන්නට එයින් ඔහු ලැබූ තෘප්තියක් නොවීය.

යළිත් බ්‍රැන්ඩි වීදුරුවක් හිස් කළ ඔහු, සෝපාවට හේත්තු වී කල්පනා කළේය. ඔහුගේ ඉදිරියට ඉලිප්පි ඇති මඳක් විශාල වූ දෙනෙත් රූපවාහිනී තිරයේ වූ දර්ශන දෙසට එක එල්ලේම යොමු වී ඇත.

ඔහු තීරණයක් ගෙන තිබිණ.

තම ජංගම දුරකථනය අතට ගත් ඔහු ඇමතුමක් ගත්තේය.

∞

ජමීලාගේ සියුම් කෙඳිරිලි හඬ කෙමෙන් වැඩිවන්නට වූයෙන් සහීර් ඔහුගේ එක් අතකින් ඇයගේ කට වැසුවේය. ඇයගේ වැසී තිබූ දෑස් විවර වී ඔහු දෙස බැලීය. සහීර් ඒ දෙනෙත් දෙසම බලා සිටියේය. ඇයට තවත් දෙනෙත් විවර කර සිටීමට හැකිවූයේ නැත.

දෙනෙත් වසාගත් ඇය සහීර් ඇයගේ කට වසා සිටි අතෙහි අල්ල විකා ගනිමින් සිටියාය. සහීර්ගේ සිරුර තවත් වේගයෙන්

ඇයගේ සිරුර හරහා ඇදී යන්නට විය. ඇය සහීර්ගේ බෙල්ල වටා අතක් යවා ඔහුව තවත් ඇයගේ තුරුලට තද කරගත්තාය.

එක් වරම සහීර්ගේ ජංගම දුරකථනය නාද දෙන්නට පටන් ගත්තේය.

ඒත් සහීර් එය ගණන් ගත්තේ නැත. ඔහු තවත් වේගවත් විය. තවත් ස්වල්ප මොහොතකින් සියල්ල අවසන් වනු ඇත.

ඒත් දුරකථනයේ නාද වීම නොනවත්වාම ඇසිණ. එය ඔවුන් දෙදෙන සිටි ඇඳට මඳක් එහා පසින් වූ මේසයක් මත තබා තිබුණෙන් එහි ශ්වේත වර්ණ තිරය නිවි නිවී දැල්වෙන්නට විය. අන්ධකාර කාමරය තුල මෙය මැනවින් පෙනුණි.

සහීර් නැවත්වීය.

ඔහුට තවත් ඔහුගේ මනස පාලනය කර ගත නොහැක.

"සොරි කෙල්ලේ" කී ඔහු ඇඳෙන් නැගිට ගොස් දුරකථනය අතට ගත්තේය. එහි නීල්ගේ නම සටහන් වී ඇත.

"බොස්ගෙන්" ජමීලා දෙසට හැරී කී ඔහු එයට පිළිතුරු දුන්නේය.

"සර්"

"සහීර් , ඉක්මනට වරෙන් මගේ ගෙදරට"

නීල් කීවේ එපමණකි. ඔහු ඇමතුම විසන්ධි කර දැමුවේය.

∞

සහීර් ඉක්මනින්ම ඇඳුම් ඇඳගත්තේය. ජමීලා පොරෝනයෙන් ඇයගේ නිරුවත් ශරීරය වසා ගෙන ඔහු දෙස බලාගෙන සිටියාය. ඇයගේ දෙනෙත් වේදනාවෙන් බර වී ඇත.

ඇය කිසිවක් නොකීවාය. ඇඳුම් ඇඳගත් සහීර් ජමීලා දෙසට නැඹුරු විය. ඇයගේ දෙනෙත් දෙස මොහොතක් බලා සිට

නළලත සිම්බේය.

"මම ආයේ ඇවිත් ඉවර කරන්නම්" සියුම් මදහසක් සමග ඔහු කීවේය.

ජමීලා සිනාසුනේ නැත. ඒ වෙනුවට පොරෝනයත් සමගම ඇය ඇදෙහි අනිත් පැත්තට හැරුණාය. ජමීලා අමනාප වී ඇති බව සහීර් තේරුම් ගත්තේය. එහෙත් වෙන කිරීමට දෙයක් නොමැත. මේ රාජකාරි ඇමතුමකි. පෞද්ගලික ජීවිතය එයට වඩා පිටුපසින් තැබිය යුතුය.

# නිල් චිත්‍රපට

සහීර් නීල්ගේ නිවසට පැමිණෙන විට මධ්‍යම රාත්‍රියත් පසු වී තිබුණි.

"සර් මොකක්ද ඒ ප්ලාස්ටික් ගඳ?" නිවසට ඇතුලු වෙද්දීම සහීර් ඇසුවේය.

නීල් කිසිත් කීවේ නැත. ඒ වෙනුවට සහීර් දෙස බලා

"ඇතුලට වරෙන්" කී ඔහු, සහීර්ව නිවස තුලට රැගෙන ගියේය.

මෙම නිවස කුලී නිවසක් වූ අතර හින්නළුව පොලිසියේ මීට පෙර ස්ථානාධිපතිව සිටි නිලධාරීන් සියල්ලම තම සේවා කාලය තුල නිල වශයෙන් පදිංචිවී සිටියේ මෙම නිවාසයේය. එහෙයින් හින්නළුව ප්‍රදේශයේ මිනිසුන් මෙය

"පොලිස් නිවස" ලෙස හැඳින්වීමට පුරුදුව සිටියෝය.

සහීර් නීල් සමග නිවසේ මැද සාලයට පැමිණියේය.

මෙම කාමරය එක් විදුලි බුබුලකින් පමණක් ආලෝකවත් කර තිබුණු අතර එහි එක් කොනක දැල්වුනු රූපවාහිනී යන්ත්‍රයක් විය.

"ඔතන ඉඳගනින්. උඹ මේක බලන්න ඕනේ. ඒකයි මම උඹට එන්න කිව්වේ. හෙට උදේම මේවත් අරගෙන මම කොළඹ යනවා"

"ඒ ඇයි සර්" සහීර් ඇසුවේය.

"හෙඩ් ඔෆිස් එකින් ආපු ඕඩර් එකක්" නීල් කෝපය ආරූඪ වූ මුහුණකින් යුක්තව කීවේය.

"උඹ කිව්ව දේ හරි. සිරිමෙවන්ගේ පොන්න තානායමට ගොඩක්

එවුන් ඇවිත් තියෙනවා. උන් තවමත් බයෙන් ඉන්නවා ඇත්තේ මේවා ලීක් වෙයි කියලා. මේ ඩීවීඩී ටික කොළඹට ගියාට පස්සේ උඹට තියා ආයේ මොකාටවත් මේවා බලන්න වෙන්නේ නැහැ. ඒ නිසා දැන්මම බලාගනින්" කියූ ඔහු රිමෝට්යේ බොත්තම එබීය.

එයත් සමගම ඩීවීඩී තැටිය ධාවනය වන්නට පටන් ගත්තේය.

"මේවා සේරම සිරිමෙවන්ගේ තානායමට ආපු එවුන්ගේ ඒවා. සිරිමෙවන් මොන හේතුවකට හරි මේවා රෙකෝඩ් කරලා තියෙනවා"

ඒවා සම්පූර්ණයෙන්ම තානායම තුලම සගවා තිබුණු රහසිගත කැමරාවකින් පටිගත කරන ලද ඒවාය. ටික මොහොතක් එතැන සිටි නීල් සිගරට් පැකට්ටුවත් ගෙන මිදුලට ගියේය. මිදුලේ සිට සිගරට්ටුව උරන ගමන් ඔහු කිහිප වතාවක්ම විවෘත වී ඇති ජනේලයෙන් පෙනෙන මැද සාලය දෙස බැලුවේය. ඔහු යමක් බලාපොරොත්තුවෙන් සිටියේය. සහීර් තවත් සුළු මොහොතකින්ම ඔහුට අඬගසනු ඇත.

"සර් නීල්" මොහොතකින් ඔහු බලාපොරොත්තුව සිටි හඬ ඇසිණ. නීල් සිගරට්ටුව විසිකොට නිවස තුලට ගියේය.

"සර් මේක දැක්කද?"

සහීර් රූපවාහිනියේ තිරය දෙස විජ්ඹික්තව බලාගෙන සිටින ගමන් ඔහුගෙන් ඇසීය.

"ඔව්" නීල් කිසිම ගානකින් තොරව කීවේය.

"ඒක තමයි මම උඹට එන්න කිව්වේ" කී ඔහු රිමෝට්ය අතට ගෙන එය තවත් ඉදිරියට ෆෝවර්ඩ් කළේය. ටික දුරක් ගිය පසු එය නැවැත්වූ ඔහු සහීර් දෙස බලා මෙසේ කීවේය.

"මේකත් බලපන්"

සහීර් මොහොතක් ඒ දෙස බලාගෙන සිටියේය. ඔහුගේ දෑස

කුතුහලයෙන් දිලිසෙන්නට පටන් ගත්තේය. වික්ෂිප්ත වූ දෑසකින් යුක්තව නීල් දෙස බැලූ ඔහු,

"සර්, මිනිහත් එහෙනම් එහෙමද, මූ දෙන ලොරි ටෝක් වල හැටියට මම හිතුවේ පාර්ලිමේන්තුවේ ඉන්න එකම පිරිමියා මූ කියලා?" සහීර් සිනාසෙන්නට පටන් ගත්තේය.

"මේක අපිට නැතිව වෙන කාට හරි හම්බුනානම් ලොතරැයියක් ඇදුනා වගේ තියෙයි."

"ලොතරැයි?" නීල් ඩීවීඩී යන්ත්‍රය නිමා දැමුවේය.

"ලොතැරැයි කෙසේ වෙතත් ඉක්මනටම පරලොව යන්න පුළුවන්"

"සර් හිතන්නේ සිරිමෙවන්ව මැරුවේ මේකේ ඉන්න එකෙක් කියලද ?"

"වෙන්න පුළුවන්. උන් තානායමට ගිනි තිබ්බෙත් මේවා නැතිකරන්න වෙන්න පුළුවන්. ඒත් සිරිමෙවන් කොහොම හරි මේවා ටික හංගගෙන ඉදලා තියෙනවා. සමහර වෙලාවට ඌ තවත් එවුන්ට මේවයෙන් කොපීස් දීලා ඇති. උගේ මරණය සිද්ද වුනොත් රිලීස් කරන්න"

නීල් ඔහුගේ දෙනෙත් තුල මවාගත් සැකයකින් යුක්තව පැවසුවේය.

"සර් එහෙම හිතනවද?" නීල් එය පවසා කට ගන්නටත් කලින් සහීර් විමතියකින් යුත් සිහින් හඬකින් ඇසීය.

"ඔව්, උඹ හිතනවද සිරිමෙවන් නිකන්ම මැරිලා යයි කියලා?, මම නම් හිතන්නේ නැහැ. අනික මේ ඩීවීඩී දෙක මට ලැබුණේ සිරිමෙවන්ගේ අල්මාරියේම රහස් ලාච්චුවක තිබිලා. ඒක ඕන කෙනෙක්ට මේවගේ ඒවා හොයා ගන්න පුළුවන් තැනක්. මේ ඩීවීඩී දෙක ඒ තරම් වටිනවනම්, සිරිමෙවන් කොහෙත්ම මේවා ඒකගේ කාමරයේ තියාගන්නේ නැහැ" නීල් කල්පනා කළේය.

"නැහැ... මේ කොපීස් දෙකක් විතරයි, තවත් ඒවා මිනිහා

කොහේ හරි හංගලා ඇති, එහෙම නැත්නම් අඳුරන අය ළඟ අරන් තියලා ඇති, මොකක් හරි වුනොත් රිලීස් කරන්න" ඔහු කීවේය.

සහීර් එම පිළිතුරෙන් තෘප්තිමත් වූ බවක් පෙනිණ.

"එහෙම වුනොත් නම් අපිට හොඳ හොඳ සෙල්ලන් ටිකක් බලාගන්න පුළුවන්, එහෙම නැති වුනොත් අපිම මේවා රිලීස් කරමු" සහීර් සෙමෙන් නීල්ගේ කනට කර පැවසුවේය.

ඒත් සමගම ඔහුගේ දෙනෙත ටීපෝව උඩ වූ ඩීවීආර් යන්ත්‍රයට යොමුවිය. ඒ දෙසම මොහොතක් බලා සිටි සහීර් නීල්ගෙන් මෙසේ ඇසුවේය.

"සර් සීසීටීවී වලින් මුකුත් හොයාගන්න බැරිවුනාද?"

නීල් අපේක්ෂා භංගත්වයකින් යුක්තව හිස දෙපසට සෙලවීය.

"නෑ... ඒකෙන් වැඩක් නැහැ හාර්ඩ් එක සම්පූර්ණයෙන්ම ගලවලා අයින් කරලා"

ඔහු කීවේය.

# උඹ කවුද ?

## දිනය ජූනි 8

නීල් කොළඹ මූලස්ථානයට ගොස් පැමිණෙමින් තිබුණි. අනතුරින් පසුව ඔහුගේ කොරොල්ලා රථය යළි අලුත් වැඩියා කර තිබුණු අතර, ඔහු කාරය පෙරට වඩා සෙමෙන් පැදවූයේය. අඩුම තරමින් හින්නළුව ගම්මානයට ඇතුලු වූ පසුව ඔහු වේගය වැඩි නොකළේය. කිසිම මනුස්ස ප්‍රාණයක් දකින්නට නැති පාලුවට ගිය හින්නළුවේ කුඩා අතු පාරවල් ඔහු විශ්වාස කළේ නැත. කුමන හෝ මොහොතක මෙවැනි නිශ්ශබ්ද ජන ශූන්‍යව ගිය තැන් වල අද්භූත දෙයක් සිදුවිය හැක.

ඔහු සෙමෙන් කාරය එම අතු පාර දිගේ ඉදිරියට ගෙනවිත්, හින්නළුව දෙසට පැමිණෙද්දී කාරය පෙරලී ගිය හතරමං හංදිය අසල එය නැවැත්වීය. මෙම හතරමං හංදියට නුදුරින් විශාල අතුපතර විහිදී ගිය සියඹලා ගසක් ඇත. එම සියඹලා ගස නිසාම හංදියට නුදුරෙන් පිහිටි මාවත සම්පූර්ණයෙන්ම අඳුරු වී ඇත.

ඔහු එම අද්භූත ඡායාව දුටුවේ මෙතැනය. ඔහු එය නිශ්චිතවම දැනගත්තේය. එම ස්ථානය දෙස මොහොතක් නිශ්ශබ්දව බලා සිටියේය.

"කොයිද උඹ?"

"වරෙන් මගේ ඉස්සරහට"

"වරෙන්"

ඒ දෙස බලා සිටියදීම ඔහු සෙමෙන් මිමිනුවේය. ඔහුගේ විශාල

දෙනෙත් වල පලිගැනීමක් නොවීය. ඒත් ඒ තුල අවිනිශ්චිත වූ බලාපොරොත්තුවක් ඇත. එම දර්ශනය සත්‍ය එකක් යැයි ඔහු මොහොතකට හෝ විශ්වාස කොට ඇත.

එය යළිත් දැකගත යුතු යැයි ඔහු තීරණය කොට ඇත. ගිනි ගෙන දැවෙන එම පුද්ගලයා ගැන ඔහුගේ සිතෙහි දයානුකම්පාවක් ඇති වී ඇත. ඔහු කවරෙක්ද?

මේ මායාව අහම්බයෙන් හටගත් එකක්ද නැතහොත් කිසියම් හේතුවක් නිසා තම දෙනෙත් ඉදිරියේ දර්ශනය වූ එකක්දැයි ඔහු දන්නේ නැත. ඒත් එය යළිත් දැක ගැනීමට ඇති කුතුහලයෙන් ඔහු වට පිට බැලුවේය.

එය දුටු ආකාරයෙන්ම එය ඔහුගේ මනසේ තැන්පත් වී ඇත. ගිනි ගෙන දැවෙද්දි ඔහුගේ දෙනෙත එක එල්ලේම තමන් දෙස එල්ල වී තිබුණු ආකාරය ඔහුගේ මනසට මැවී පෙනුණි.

ඒවා තුල බලාපොරොත්තුවක් නොවීය. තවත් ජීවත් විය යුතු යැයි අපේක්ෂාවක් ඒවායේ නැත. කිසියම් වූ හේතුවක් නිසා ජීවත්වීමට ඇති ආශාව ඒ දෙනෙත් වලින් සම්පූර්ණයෙන්ම පහව ගොස් ඇත. ඒත් එයටත් වඩා එහි අසරණකමක් විය. දැඩි ස්නේහයකින් පිරුණු හදවතක් විය.

නීල්ගේ මනස මෙම සිතුවිලි වලට කිඳා බසිද්දි එක් වරම ඇවිස්සි ගිය දුහුවිළි පොදක් නිසා ඔහු පියවී සිහියට පැමිණියේය. සිහින් සුළඟක් විත් දූවිල්ලෙන් පිරුණු වීදියෙහී ගැටෙන්නට ඇත.

එයින් ඉහළට නැගුණු දූවිලි කවාකාර සුළියක් මවමින් ඉහළට එසවී අතුරුදහන් වී ගියේය. නීල් සාක්කුවේ තිබුණු සිගරට් පැකට්ටුව ගෙන එයින් සිගරට්ටුවක් දල්වා කාරයට හේත්තු විය. එතැන් සිට ඔහු නුදුරෙම පෙනෙන සියඹලා ගස දෙස මොහොතක් වෙලා බලාගෙන සිටියේය.

මෙම දැවැන්ත සියඹලා ගස කිසියම් වූ හේතුවක් නිසා ඔහුගේ මනස වෙනස් කළේය. ඒ දෙස බලා සිටියදී කිසියම් වූ අපහැදිලි ඡායවන් ඔහුගේ මනසේ හොල්මන් කරන්නට ගත්තේය. එම

සියඹලා ගසත් එය අසලම ඇති හතරමං හංදියත් පිළබඳව කිසියම් වූ අපහදැලි සිතුවිල්ලක් ඔහුගේ මනසේ ඇත. ඒත් ඒ කුමක්දැයි නිශ්චිතව තෝරා ගැනීමට නීල්ට නොහැකි විය.

තවත් විනාඩි කිහිපයක් එතැන නතර වී සිටි නීල් පරාජිතයෙකු අවසානයේදී පීඩනයෙන් අසරණව තමන්ටම සිනහවක් නගා ගනිමින් යළිත් කාරයට නැග්ගේය.

කාරය පණගැන්වූ ඔහු අතුපාර දිගේ ඉදිරියට යන්නට විය.

මෙතැන පසුකර ටික දුරක් යද්දි ඔහුගේ දුරකථනය නාද විය .

"හෙලෝ"

නීල් පිළිතුරු දුන්නේය.

"සර් ආයෙමත් ඒ සියඹලා ගහ යටට යන්න"

"මොකක්"

නීල් එක්වරම කාරයේ තිරිංග තදකළේය. කාරය දූවිලි අවුස්සමින් ඉදිරියට ගොස් එතැනම නතර විය.

"උඹ කවුද ?"

නීල් කාරයේ ජනේලයෙන් එබී පිටත බැලුවේය. මුළු මාවතම තනිකරම පාළුවට ගොස් ඇත. හවස පහේ හෝරාව ගෙවී යමින් තිබුණෙන් මාර්ගය දිලිසෙන පැහැදිලි ආලෝකයෙන් යුක්ත විය. මාර්ගයේ කිසිවෙකුත් නොවීය.

"සර්, මාව හොයලා වැඩක් නැහැ, මම කියන දේ කරන්න ආයෙත් ඒ සියඹලා ගහ ළඟට යන්න"

දුරකථනයේ සිටි තැනැත්තා යළිත් පැවසුවේය.

නීල් කාරයෙන් බැස්සේය. බැස හාත්පසම විහිදී යන බැල්මක් හෙලුවේය. මාර්ගය එක් පසෙක වූ දිගුව විහිදී ගිය කෙත් යායත් අනෙත් පසින් වූ වන ලැහැබත් සුළඟින් සෙලවෙන ගස් කොළන් වල ඇති සියුම් නාදයත් හැරෙන්න එහි වෙන කිසිවක් නොවීය.

"උඹ දන්නවද මම කවුද කියලා?"